**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්ථාවේ 1.6.1 (ඇ) (i) හා (II) ඡේදයන්හි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් නොවන ලැබීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර මුද්‍රිත අනුව තැන්පතු ගිණුම් වාර්තාවේ (SA30) සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු ලැබීම් රු.193,645,218ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් යටතේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තැන්පත් ලැබීම් ලෙස රු.1,136,086,512ක් ලෙස දැක්වීම හේතුවෙන් භාණ්ඩාගාර මුද්‍රිත හා මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබූ තැන්පතු ලැබීම් අතර රු.942,441,294ක වෙනසක් පැවතුණි. | මූල්‍ය කාර්යය සාධන වාර්තාවේ දැක්වෙන දත්තයන් නිවැරදි වන අතර භාණ්ඩාගාර මුද්‍රිතයන්හි සඳහන් දත්ත නිවැරදි නොවේ. 2022 වර්ෂයේ SA 30 ආකෘතියට අනුව තැන්පතු ගිණුම් වාර්තාවේ අවසන් ශේෂය 2023 වර්ෂයේ SA 30 ආකෘතියේ ආරම්භක ශේෂය විය යුතු වුවත් එහි වෙනත් වැරදි දත්තයන් දැක්වේ. | වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර භාන්ඩාගාර මුද්‍රිත නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂ පිරික්සුමෙහි (SA21) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ අය වූ අත්තිකාරම් ලැබීම් වටිනාකම රු.60,471,451ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.69,413,731ක් වීම හේතුවෙන් භාණ්ඩාගාර පොත් හා මූල්‍ය කාර්යසාධන වාර්තාවේ දක්වා තිබූ අත්තිකාරම් ලැබීම් අතර රු.8,942,280ක වෙනසක් පැවතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අත්තිකාරම් ගිණුම පහත සඳහන් වර්ග දෙකකට අයත් වේ.<br>1. රාජ්‍ය නිලධාරීන් සඳහා අත්තිකාරම් ගිණුම<br>2. බලයලත් භාණ්ඩාගාර අත්තිකාරම් ගිණුම<br>මෙම වර්ෂයේ බලයලත් අත්තිකාරම් ගිණුම යටතේ රු.3,993,535 අත්තිකාරම් ගිණුමේ වියදම සටහන් කළ | වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර භාන්ඩාගාර මුද්‍රිත නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නිසාත් 118011 යටතේ රු.1,250 මුදල 2003.02.99.00 යන ආදායම් ගිණුමට පෙන්වා දීම වෙනුවට සඳහන් කර තිබූ නිසාත් වරද සිදුවූ බව දන්වා සිටිමි. | |

**(ආ) පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂ පිරික්සුමෙහි (SA21) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව දරන ලද පුනරාවර්තන වියදම රු.4,520,261,907ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව රු.4,523,217,502ක් වීම හේතුවෙන් භාණ්ඩාගාර පොත් හා මූල්‍ය කාර්යසාධන වාර්තාවේ දක්වා තිබූ පුනරාවර්තන වියදමෙහි රු.2,955,595ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශයේ දත්ත නිවැරදි වේ. | වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට භාණ්ඩාගාර මුද්‍රිත පෙර නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) තැන්පතු**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර මුද්‍රිත අනුව තැන්පත් ගිණුම් වාර්තාවේ (SA 30) සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු ගෙවීම් රු.350,459,640ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ගෙවීම් වටිනාකම රු.1,144,057,460ක් වීම හේතුවෙන් භාණ්ඩාගාර පොත් හා මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ තැන්පතු ගෙවීම් අතර රු.793,597,820ක වෙනසක් පැවතුණි. | මූල්‍ය කාර්යය සාධන වාර්තාවේ දැක්වෙන දත්තයන් නිවැරදි වන අතර භාණ්ඩාගාර මුද්‍රිතයන්හි සඳහන් දත්ත නිවැරදි නොවේ. 2022 වර්ෂයේ SA 30 ආකෘතියට අනුව තැන්පතු ගිණුම් වාර්තාවේ අවසන් ශේෂය 2023 වර්ෂයේ SA 30 ආකෘතියේ ආරම්භක ශේෂය විය යුතු වුවත් එහි වෙනත් වැරදි දත්තයන් දැක්වේ. | වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර භාණ්ඩාගාර මුද්‍රිත නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගිණුම් වාර්තාවේ (SA30) ඇතුළත් තැන්පතු ගිණුම්වල ඉකුත් වර්ෂය අවසානයට දක්වා ඇති ශේෂය රු.79,564,819ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ශේෂය රු.228,408,294ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ආරම්භක ශේෂය අතර රු.148,843,475ක වෙනස්කමක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශයේ දත්තයන් නිවැරදි වන අතර භාණ්ඩාගාර තැන්පතු ගිණුම් වාර්තාවේ (SA30) ඇතුළත් තැන්පතු ගිණුම්වල ඉකුත් වර්ෂය අවසානයේ ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය නොගැළපේ. මෙය භාණ්ඩාගාර දත්ත පද්ධතියේ දෝෂයකි. | - එම - |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දමන, අඩ්ඩාලච්චානේ, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් ද පදියතලාව හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දෙකට අයත් නිල නිවාස හා රජයේ නිවාස ද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් කර ඇතත් මෙතෙක් තක්සේරු කර නොමැත. සිහිකැඳවීම් ගණනාවක්ද තක්සේරු දෙපාර්මේන්තුව වෙත යොමු කර ඇත. අදාළ තක්සේරු වාර්තාව ලද වහාම වත්කම් සඳහා ඇතුළත් කර ගෙන මූල්‍ය ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කරමි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් හඳුනා ගනිමින් ඒවා නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2017 හා 2018 වර්ෂයන්හි දී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම රු.46,422,256ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති අතර නිලසෙවන ගොඩනැගිලි ඉදිකිරීමට වැය වූ මුදල අනුව ගොඩනැගිලි වටිනාකම සිගාස් වැඩසටහන හරහා වත්කම් සඳහා ඇතුළත් කර ගැනීමට කටයුතු කරමින් පවතියි. ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමෙන් පසු තක්සේරු කර සිගාස් වැඩසටහන හරහා වත්කම් සඳහා ඇතුළත් කර ගැනීමට කටයුතු කරමින් පවතියි. | - එම - |

| | | | |
|---|---|---|---|
| (iii) | සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA82) අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට කෙරීගෙන යන වැඩ යටතේ රු.7,130,174ක් වටිනා රජයේ නිවාස හා සංචාරක නිවාස ද රු.28,500,000ක් වටිනා කාගෝ වාහන ලෙස එකතුව රු.35,630,174ක් පවතින බව දක්වා තිබුණ ද භෞතිකව එවැනි කෙරීගෙන යන වැඩක් හෝ කාගෝ වාහන ද නොපවතින බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන දත්තයන් නිවැරදි වන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිගාස් වැඩසටහනේ දත්ත අනුව එවැනි භෞතිකව කෙරීගෙන යන වැඩ හෝ කාගෝ වාහන පිළිබඳ දත්තයන් නොපවතියි. | මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ (SA82) ඇතුළත් මූල්‍ය නොවන වත්කම්වල ඉකුත් වර්ෂය අවසානයට දක්වා ඇති ශේෂය රු.3,418,509,241ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ශේෂය රු.6,786,702,138ක් ලෙස දැක්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ආරම්භක ශේෂය අතර රු.3,368,192,897ක වෙනස්කමක් පැවතුණි. | මෙය මූල්‍ය නොවන වත්කම්වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල වැරදි ලෙස සටහන් වීම නිසා සිදු වූවකි. | වෙනස්කම් හඳුනාගනිමින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට පෙර භාණ්ඩාගාර මුද්‍රිත නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට මූල්‍ය නොවන වත්කම් ගිණුම් සාරාංශ වාර්තාවෙහි (SA80) වත්කම් අයිතම හතරකට අදාළ ආරම්භක ශේෂය රු.3,718,140,210 ක් වුවද සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) තුළ එම වත්කම් අයිතම හතරට අදාළ ආරම්භක ශේෂය රු.7,417,865,709කි. ඒ අනුව, වාර්තා දෙකෙහි මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන් අතර රු.3,699,725,499ක වෙනස්කමක් පැවතුණි. | මෙය මූල්‍ය නොවන වත්කම්වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත පිටපත්වල වැරදි ලෙස සටහන් වීම නිසා සිදු වූවකි. | -එම - |

| | | |
|---|---|---|
| (vi) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.35,609,488ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ - (SA82) එය රු.35,474,687ක් වූයෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා භාණ්ඩාගාර පොත් අතර මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකමෙහි රු.134,801ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශයේ දත්ත නිවැරදි වේ. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් පමණක් දැරිය යුතු වුවද, දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන වියදම් සඳහා ලබා දී තිබූ රු.3,390,123ක ප්‍රතිපාදන යටතේ සංස්කෘතික මධ්‍යස්ථානයේ විදුලි බිල්පත් පියවීම, සැලසුම් අංශයේ දුරකථන බිල්පත් පියවීම වැනි කාර්යයන් සඳහා එකතුව රු.142,025ක මුදලක් වියදම් කර තිබුණි. | 2022/2023 මහ කන්නයේ මිලදී ගැනීම හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන පෙබරවාරි මාසයේ ආරම්භ වූ බවත් එම සංකීර්ණ ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතුව එම කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින් හා සැලසුම් අංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුව දමන සංස්කෘතික මධ්‍යස්ථානයේදී ක්‍රියාත්මක වි ඇති බවත් එබැවින් සංස්කෘතික මධ්‍යස්ථානයේ ජල හා විදුලි බිල්පත් පියවීමටත් සැලසුම් අංශයේ දුරකථන බිල්පත පියවීමටත් මෙම වැඩසටහන සඳහා යොදවා ගත් නිලධාරින්ගේ අතිකාල සහ ගමන් වියදම් ඉහත මුදලින් දැරූ බවත් ප්‍රාදේශීය ලේකම් වාර්තා කර ඇත. | කිසියම් වැය විෂයක් සඳහා ලබාදෙන ලද ප්‍රතිපාදන යටතේ එම වැය විෂයට අදාළ වියදම් පමණක් දැරිය යුතුය. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | **කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය** | | |
| (I) | ග්‍රාම ශක්ති වැඩසටහන 2018 සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ග්‍රාම ශක්ති සමිති සාමාජිකයන් වෙත ලබා දෙන ලද රු.132,202,409ක ණය මුදලකින් රු.79,784,715ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය වී නොතිබුණි. | සමය මණ්ඩලය වෙත යොමු කර ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (II) | ග්‍රාම ශක්ති වැඩසටහන සම්බන්ධයෙන් සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය මඟින් නිකුත් කරන ලද අංක SDB/SPV/GS/2022/චක්‍රලේඛ 01 හා 2022 ජුනි 28 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සක්‍රීයව පවතින ග්‍රාම ශක්ති මව් සමිතිවල පවතින මුදල් උපයෝගී කර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් සඳහා, අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සහ සමිති සාමාජිකයන් සඳහා අත්‍යවශ්‍ය අනෙකුත් වැඩසටහන් සඳහා වන ව්‍යාපෘති සඳහා යොදාගත හැකි වුවද අම්පාර දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි සමිති 244 අතරින් සක්‍රීයව පවතින සමිති 138ක් චක්‍රලේඛය අනුව තම අරමුදල් භාවිතා නොකර තම බැංකු ගිණුම්වල එකතුව රු.29,576,689ක මුදලක් නිෂ්කාර්යව රඳවාගෙන තිබූ අතර ලියාපදිංචි මුළු සමිති අතරින් 2023 වර්ෂය වන විට අක්‍රීය සමිති 106 ක ඔවුන්ගේ බැංකු ගිණුම් තුළ රු.7,923,492ක මුදලක් රඳවාගෙන තිබුණි. | සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය මගින් 2024.04.09 දිනැතිව යොමු කර ඇති අංකSDB/GS/DIST/2024 ලිපියේ උපදෙස් පරිදි අක්‍රීය ග්‍රාම ශක්ති සංවර්ධන සමිති සතු අරමුදල් සක්‍රීය සමිති වෙත ලබාදීමට කටයුතු කරමින් පවතින අතර සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නමුත් මේවන විටත් අක්‍රීය සමිති ලියාපදිංචිය අහෝසි කිරීමටද මේ වන විට කටයුතු ආරම්භ කර ඇත. | සුදුසු ප්‍රතිලාභීන් තෝරාගෙන ණය නිකුත් කර වැඩසටහන් සක්‍රීයව සිදුකර ගෙන යාමට ඉදිරියේ දී කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 2009/09 දරණ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 2.iv වගන්තිය | 194,220 | වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද නියැදි විගණන පරීක්ෂාව අතර මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් වෙත 2023 වර්ෂය සඳහා එලෙස ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමකින් තොරව අතිකාල හා නිවාඩු දින දීමනා ගෙවීම් කර තිබුණි. | සිදුවූ වරද ප්‍රාදේශීය ලේකම් හා කාර්ය මණ්ඩලය පිළිගෙන ඇත. මින් ඉදිරියට චක්‍ර ලේඛ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දැනුම් දි ඇත. මේ වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මකව පවතින අතර එහි දත්ත මත පදනම්ව අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සිදුකරනු ලබයි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 මාර්ගෝපදේශය | අඬඩාලච්චේන හා තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණික කමිටු නිර්දේශය නොමැතිව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි. | අඬඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුව තාක්ෂණික කමිටුව නොමැතිව අදාළ මිලදී ගැනීම් කටයුත්ත සිදුකළ බවත්, එමෙන්ම තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුව තාක්ෂතා ඇගයීම් කමිටුවේ සමහර සාමාජිකයින් නිවාඩු ගොස් ඇති හෙයින් කමිටුවේ නිර්දේශය නියමිත වේලාවේදී ලබා නොගෙන අදාළ මිලදී ගැනීම් කටයුතුවල නිරත වී ඇත. ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, ප්‍රසම්පාදන අත්පොත හා ව්‍යාතිරේඛ උපදෙස් දැඩිව පිළිපදින ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණයෙ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අඬඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කොට්ඨාශයේ පාසලක් සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ රු.6,500,000ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් | මෙම මුදල අඬඩාලච්චේන අක්/අල්/අර්හම් පාසලට අදාළව පෞද්ගලික ඉඩමක් පවරා ගැනීමේ කටයුත්ත සඳහා තැන්පත් ඇත. අදාළ ඉඩම සඳහා පවරා ගැනීමේ කටයුත්ත සඳහා අධික කාලයක් වැය වන පියවර කිහිපයකින් සමන්විත කාර්යයකි. එම | නියමිත කාලය තුළ වැඩ අවසන් කර තැන්පතු ගිණුම නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුමෙහි වර්ෂ 05ක කාලයක සිට රඳවාගෙන තිබුණි. | සෑම පියවරක් සඳහාම වෙන වෙනම ඉඩම් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගත යුතුව ඇත. තවද මිනින්දෝරු සැලැස්ම ලැබීමේ ප්‍රමාදයක් ඇති අතර සියළු පියවරයන් සම්පූර්ණ වූ පසු ගෙවීම් කර අදාල ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් දැනුම් දී ඇත. | |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබූ ලියාපදිංචි සහතික නොමැති, අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි අංක RA – 3273 දරන ට්‍රැක්ටර් රථය 2018 වර්ෂයේ සිට ධාවනය කිරීමට නොහැකි වීම හේතුවෙන් කාර්යාල භූමියේ ගාල්කර තිබුණි. එම රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ නොමැති නම් අපහරණයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙන්දේසි කිරීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති අතර අතිරේක දිස්ත්‍රික් ලේකම්ගේ සභාපතීත්වයෙන් යුතු වෙන්දේසි කමිටුව මඟින් ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී. | කඩිනමින් අපහරණයට කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පැවති රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් ස්වේච්ඡා සංවිධානයක් වෙත ලබා දී තිබූ සංයුක්ත කොළ මඩින යන්ත්‍ර දෙකක්, ට්‍රැක්ටරයක් හා ටේලරයක් එම ස්වේච්ඡා සංවිධානයේ ආරවුලක් හේතුවෙන් 2012 වර්ෂයේ දී මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධ කිසිඳු පියවරක් ගෙන නොතිබුණු අතර අදාල වාහන මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය. | මෙය රජයේ වත්කමක් නොවන අතර රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධානයක් වෙත ලබා දී ඇත. මෙම උපකරණ, ස්වේච්ඡා සංවිධානයේ ඇති වූ ආරවුලක් හේතුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත භාරදී ඇත. විගණන කළමනාකරණ කමිටුව වෙත යොමු කර එහි නිර්දේශ පරිදි කටයුතු කරමි. | අදාළ ස්වේච්ඡා සංවිධානය සමඟ සාකච්ඡා කර අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් පසුගිය වර්ෂ 22කට අධික කාලයක සිට අලුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාර දී තිබුණත්, එය අලුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | මෙම ලොරි රථය දිරා ගොස් ඇති බැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රැගෙන ඒම අපහසු වී ඇති බැවින් එම ස්ථානයේදීම වෙන්දේසි කිරීමට තීරණය වි ඇත. මෙම ලොරි රථය පුනරුත්ථාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති බැවින් වත්කම් චක්‍රලේඛ 03/2008 අනුව අයිතිය දිස්ත්‍රික් ලේකම් නමින් පවරා ගත යුතුවේ. පුනරුත්ථාපන අමාත්‍යාංශයක් මේ වන විට නොමැති අතර එම විෂය කටයුතු කරනු ලබන අමාත්‍යාංශය හඳුනා ගැනීම දුෂ්කර වි ඇත.කෙසේ වෙතත් මෙම රථය පවරා ගැනීම සම්බන්ධ ඉල්ලීම අධිකරණ හා බන්ධනාගාර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | මුදල් අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2020 ඔක්තෝබර් 02 දිනැති හා අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව භාවිතයට ගත නොහැකි රථවාහන කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා යතුරු පැදි 10ක් ධාවනයට යොදා නොගැනීම හේතුවෙන් වර්ෂ 04කට අධික කාලයක සිට ගබඩා සංකීර්ණයේ නවතා තබා තිබුණි. | ධාවනයට නුසුදුසු යතුරු පැදි 5ක් හාඩි කාර්මික විද්‍යාලයේ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබාදී ඇත. තාක්ෂණික කමිටුවක් පත් කර ධාවන තත්ත්වයට ගැනීමට නොහැකි යතුරු පැදි හඳුනාගෙන අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2020 ඔක්තෝබර් 02 දිනැති හා අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව අලුත්වැඩියාකර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ වෙනත් අවශ්‍ය ක්‍රියාමාර්ගයන් කඩිනමින් ගත යුතුය. |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් විවෘත කර භාණ්ඩ රැගෙන යාම නිසා සිදු වූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු | පරීක්ෂණ මණ්ඩල තීරණය 2023.07.06 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී ඇත. මෙම කාරණය සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් සිදුකර විනය | සිදු වී ඇති පාඩුවට වගකිව යුතු පාර්ශවයකින් අය කිරීමට හෝ වෙනත් අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් |

| | | |
|---|---|---|
| කර තිබුණ ද 2024 මැයි 07 දින වන විටත් ඒ පිළිබඳව ඉදිරි පියවර ගෙන නොතිබුණි. | ක්‍රියාමාර්ගයක් ගෙන අවසන් නොමැති නිසා මු.රෙ.104(4) අවසන් පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි බව දන්වා ඇත. | ගත යුතුය. |

### 3.4 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022/ 2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ වී මෝල් හිමියන් හරහා මිලදී ගන්නා ලද වී තොග සහල් කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හරහා නියෝග ලබාදීම සිදු නොවීම මත අදාළ කාර්යය සඳහා භාවිතයට ගැනීමකින් තොරව ආසන්න වශයෙන් රු.41,848,330ක වටිනාකමකින් යුතු සහල් කිලෝග්‍රෑම් 389,546ක ප්‍රමාණයක් 2023 අගෝස්තු 21 විගණිත දින වන විටත් මිනිස් පරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයට පත් වී තිබුණි. නියැදි විගණන පරීක්ෂණ අනුව එම පරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයට පත්ව තිබූ සහල් ප්‍රමාණයෙන් කිලෝග්‍රෑම් 158,736ක් විගණිත දින වන විටත් විධිමත් අධීක්ෂණයකින් තොරව වෙළෙඳපොල වෙත නිකුත් වී තිබූ බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තු උපදෙස් පරිදි විවෘත මිල ගණන් කැඳවා සත්ත්ව ආහාර සඳහා අලෙවි කර ඇත. වී තොග සහල් බවට පත්කර ඇතත් ප්‍රමාණවත් ඇනවුම් නොලැබීම හේතුවෙන් එම සහල් තොග කල් ඉකුත්ව ඇති අතර වී මෝල් හිමියන් විසින් එම සහල් ප්‍රාදේශීය ලේකම්ගේ අනුදැනුමකින් තොරව සත්ත්ව ආහාර ලෙස අලෙවි කර ඇත. | අදාළ වැඩසටහන සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් විසින් විධිමත් ක්‍රමවේදයක් මත නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය. |

(ආ) 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදු කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් පියවර ගත යුතු වුවත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය ව්‍යාපෘති සඳහා පරිපාලන වියදම් වෙන් කරන පරිදි සමස්ථ ප්‍රතිපාදන මුදල වන රු.3,089,000,000න් 1% ප්‍රතිශතයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17ක් සඳහා රු.30,890,000ක් පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගනිමින් චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් විසින් සත්‍ය වශයෙන් දරන ලද වියදම නොසලකා හැර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් මත යැයි සඳහන් කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර ගනිමින් එම කමිටු තීරණය අනුව අදාල නිලධාරීන්ගේ මූලික වැටුපෙන් ¼ ක වටිනාකමකට සමාන මුදලක් ඔවුන් ව්‍යාපෘතියට සම්බන්ධව වූ මාස ගණන මත පදනම්ව එකතුව රු.15,580,562 ක් පරිපාලන වියදම් ලෙස 2023 ජූලි මස වන විට ගෙවා අවසන් කර තිබුණි.

අම්පාර දිස්ත්‍රික්කය තුළින් වී මෙට්‍රික් ටොන් 30000ක් මිලදී ගත යුතු බවට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව දැනුම් දී තිබූ අතර වී මිලදී ගෙන පැය 24ක් ඇතුළත අදාළ ගොවි මහතාගේ ගිණුමට මුදල් බැර කළ යුතු විය. මෙය ඉතාමත් සංකීරණ ක්‍රියාවලියක් වූ අතර රු.මිලියන 270ක වටිනාකමින් යුත් වී තොගයක් මිලදිගෙන ගොවීන් වෙත ගෙවීම් කිරීමට සිදු විය. වී මෝල් හිමියන් තෝරා ගැනීම, ඔවුන් ලියාපදිංචි කිරීම, ගොවියන් හඳුනා ගැනීම, ඔවුන්ගෙන් මිලදී ගනු ලබන වී ප්‍රමාණය තීරණය කිරීම, වාර්තා සකස් කිරීම, බැංකු වෙත ගෙවීමට යොමු කිරීමට සිදුවීම, මෙම කාර්යයන් සඳහා රාජකාරි වේලාවෙන් බැහැරව රාජකාරි කිරීමට සිදුවීම, නිරන්තරයෙන් ක්ෂේත්‍රයට යාමට සිදුවීම, මෙම කටයුතු සඳහා පෞද්ගලික ජංගම දුරකථන ආදිය යොදාගැනිමට සිදුවීම යන කරුණු මත පූර්වගාමී දිස්ත්‍රික් ලේකම් විසින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විමසා ලද උපදෙස් අනුව කමිටුවක් පත්කර එහිදී එළඹි තීරණ මත මෙම ගෙවීම් සිදුකර ඇති අතර ගෙවීමට ප්‍රථම අංශ ප්‍රධානින්ගේ හා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ ලබාගෙන ඇත.

චක්‍රලේඛය ප්‍රකාරව සත්‍ය වශයෙන් දරන ලද පරිපාලන වියදම් පමණක් නිසි අනුමැතියකින් යුතුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ චක්‍රලේඛයේ 2.3.2 වගන්තිය අනුව මෙම වැඩසටහන 2023 මාර්තු හා අප්‍රේල් මාස තුල දී අවසන් විය යුතු වුවද 2023 අගෝස්තු 08 දින වන විටත් අදාල ගබඩාවන් තුළ ඉතිරිව තිබූ සහල් කිලෝග්‍රෑම් 420,546ක් හා වී කිලෝග්‍රෑම් 8,779,903ක තොග සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අවසන් වී නොතිබිය දී ඒ සම්බන්ධ පරිපාලන වියදම් ලෙස ඉහත සඳහන් මුදල නිලධාරීන් වෙත ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තු උපදෙස් මත වී මෙට්‍රික් ටොන් 30000ක් මිලදී ගත්තද වෙනත් දිස්ත්‍රික්කවලින් සහල් සඳහා ඉල්ලුම් නොලැබීම මත අපේක්ෂිත කාල සීමාව තුළ වැඩසටහන නිම කිරීමට නොහැකි විය. මේ වන විටත් එම වී තොග බැහැර කිරීමට කටයුතු සිදු වෙමින් පවතී. | ව්‍යාපෘතියක් සඳහා පරිපාලන වියදම් ගෙවිය යුත්තේ එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් වූ පසුවය. |
| (ඈ) | නියැදි විගණන පරීක්ෂණය අනුව උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිපාලන වියදම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ඉහත සඳහන් කමිටු තීරණය මත එක් එක් නිලධාරියාගේ මූලික වැටුපෙන් ¼ ක දීමනාවට අමතරව නිවාඩු දින වැටුප්, ගමන් වියදම් හා අතිකාල දීමනා වශයෙන්ද රු.367,181ක් නිලධාරීන් 16 දෙනෙකු වෙත ගෙවීම් කර තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා අතිකාල, නිවාඩු දින වැටුප් සහ ගමන් වියදම් වෙනුවෙන් ලබා දුන් ප්‍රතිපාදන අවසන්ව තිබූ බැවින් ගිණුම් අංශය වෙත ලබා දී තිබූ කාර්යාල නිලධාරීන්ගේ මාස කිහිපයක වවුචර්පත් සඳහා මෙම පරිපාලන වියදම් වෙනුවෙන් වෙන් වූ මුදලින් වියදම් දැරූ බව ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත. | වැඩිපුර ගෙවා ඇති මුදල නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක 01/2023 හා 2023 ජනවාරි 27 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වියදම් පාලනය සඳහා අවශ්‍යතාවය මත පමණක් අතිකාල දීමනා ගෙවීම් කළ යුතු වුවද අඩ්ඩාලච්චේන හා කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අනුමත කාර්යය මණ්ඩලය අනුව සංවර්ධන | අඩ්ඩාලච්චේන සහ කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ගෙවා ඇති අතිකාල දීමනා ගෙවීම් හදිසි සහ අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බැහැරව ඉටුකර ගැනීම නිසාත් වර්ෂ ආරම්භයේදි සහ වර්ෂ අවසානයේදි ඉටු කළ යුතු | නිලධාරීන් අතර නිවැරදි වැඩ බෙදීමක් සිදුකර කාර්යාලයේ අතිරික්ත සේවකයන්ද යොදා ගනිමින් චක්‍රලේඛය ප්‍රකාරව අතිකාල |

| | | | |
|---|---|---|---|
| | නිලධාරි හා කළමනාකරණ සේවා නිලධාරීන් 134 ක අතිරික්තයක් පැවතිය ද ඔවුන් අතර නිවැරදි වැඩ බෙදීමක් සිදු වී නොමැතිවීම මත 2023 වර්ෂය සඳහා නිලධාරීන් 35 දෙනෙකු වෙත රු.1,012,564 ක අතිකාල දීමනා ගෙවීම් කර තිබුණි. | අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා ගෙවා අති බවත් සමහර වැඩ විෂයන්වලට පුහුණුව ලද නිලධාරීන් මගින් පමණක් ඉටුකර ගැනීමට සිදුවන බැවින් (Itmis, Cigas) එම කටයුතු අනෙකුත් නිලධාරීන් යොදවා ඉටු කර ගත නොහැකි බැවින් එම රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීමට සිදුවූ බවත් රියදුරන් වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීමට ගෙවීමට සිදුවූ බවත් ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් දැනුම් දි ඇත. එමෙන්ම ඉදිරියේදී මෙම විෂයන් නැවත සමීක්ෂණය කර වැඩ බෙදීම් සිදුකොට අනෙකුත් නිලධාරීන්ද පුහුණු කිරීමට කටයුතු සලසා ඇති බවත් දැනුම් දී ඇත. | දීමනා ගෙවීම් අවම වන පරිදි කාර්යාලයේ කටයුතු සිදු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ රජය විසින් වී මිලදීගෙන අඩු ආදායම්ලාභීන් වෙත සහල් ලබා දීමෙන් අනතුරුව සහල් මෝල් හිමියන් භාරයේ පැවති රජයේ වී තොග සහල් කර අලෙවි කිරීම සම්බන්ධයෙන් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 ජූලි 17 දිනැති හා අංක DFD/MD/GPPP/PD/Maha/2022/23 දරන ලිපිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඉතිරි වී තොග විධිමත් පරිදි ටෙන්ඩර් කැඳවා අලෙවි කිරීමට උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව 2023 සැප්තැම්බර් මස සිදුකරන ලද පළමු ටෙන්ඩරය මගින් සහල් අලෙවි කිරීම සඳහා ගැනුම්කරුවෙකු තෝරාගෙන තිබුණද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07ක තිබූ වී මෝල් 24ක් විසින් රු.170,122,703ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 1,226,373ක් 2024 මැයි 05 දින වන විටත් තෝරාගත් ගැනුම්කරු වෙත අලෙවි කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මුදල් ලබාදීමට කටයුතු කර නොතිබුණි. | මෙම වැඩසටහන යටතේ සහල් මෝල් හිමියන් භාරයේ ඉතිරිව පැවති සහල් තොග සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DFD/MD/GPPP/PD/Maha/2022-23 හා 2023.07.17 දිනැති ලිපියට අනුව ප්‍රසම්පාදන කටයුතු හරහා අලෙවි කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව පළමු අදියර යටතේ තෝරාගන්නා ලද ගැනුම්කරුවන් වෙත සහල් අලෙවි කිරීමේ කටයුතු සිදුකර ලද අතර, 2024.05.20 දින වන විට අදාළ සහල් මෝල් හිමියන් විසින් සහල් කි.ග්‍රෑ.1,226,372.99 ක ප්‍රමාණයක් ලබා දීමට ඉතිරිව ඇති අතර, එම සහල්වල වටිනාකම රු.170,122,703.38කි. | අයකර ගත යුතුව සහල් ප්‍රමාණය කඩිනමින් අයකර ගැනීමට හා එසේ සහල් ලබා නොදෙන වී මෝල් හිමියන් සම්බන්ධයෙන් කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දමන, අක්කරපත්තු හා කල්මුණ යන ප්රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දී තිබූ දිගු කාලීන බදු ඔප්පුවලට අදාළව රු.24,538,440ක බදු මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි. | ❖ කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩම්වල දීර්ඝ කාලීන බදු ශේෂය ඔබ විසින් සඳහන් කරන ලද රු.2,362,517ක මුදලින් මේ දක්වා රු.680,967ක් අයකරගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු යොදා ඇත.<br><br>❖ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දීර්ඝ කාලීන බදු ගෙවන්නෙකු වන එස්.එම්.ඒ.සකි. යන අය බදු මුදල් ශේෂය ගෙවීමට නොහැකි වූ හේතුවෙන් ව්‍යාපාර අරමුණ සඳහා ලබා දෙන බදු පදනම අවලංගු කර නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දෙන ලෙස ඉල්ලා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලීමක් කර ඇත. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | අඩ්ඩාලච්චේන, පොතුවිල්, නින්දවූර් හා අක්කරෙයිපත්තුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් රජයේ ඉඩම් කැබලි 17ක අනවසරයෙන් ඉන්ධන පිරිවුම්හල්, සංචාරක හෝටල් ආදි කර්මාන්ත සිදු කරන බව නිරීක්ෂණය විය. | අඩ්ඩාලච්චේන, පොතුවිල්, නින්දවූර් සහ අක්කරපත්තු යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් අදාළ ඉඩම් කැබලි 17 ම දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීමට සියළුම ලිපි ලේඛන පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවා ඇත. ඒ සඳහා අනුමැතිය ලැබුණු විගස දීර්ඝ කාලීන බදු අයකිරීමට ක්‍රියාමාර්ග සිදුකරනු ලැබේ. | දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ පවරාදීමට හා බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2364 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 2945 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 81ක් පුරවා ගැනීමට හා 662 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්ක කාර්ය මණ්ඩලයක් පවතිනුයේ ද්විතිය මට්ටමේ සනයට ගැනෙන සංවර්ධන නිලධාරීන් වේ. එම බඳවා ගැනීම් කර ඇත්තේ අමාත්‍යාංශ මට්ටමින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුවය. පුරප්පාඩු 81ක් පවතිනුයේ අනෙකුත් කාර්ය මණ්ඩලයන් තුළ වන අතර ඒ පිළිබඳව අමාත්‍යාංශය වෙත වාර්තා කර ඇත. | පවතින පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |